# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1990 ජූනි මස 29 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 40/88

**ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, එම යෝජනා ක්‍රමය කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් මෙහෙයවනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

*ප්‍රකෘති නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

## I වන කොටස

### ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය පිහිටුවීම

**2.** (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක්, මේ පනතේ විධිවිධානවලට අනුකූල ව පිහිටුවනු ලැබිය යුතු ය.

*ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය පිහිටුවීම.*

**3.** යෝජනා ක්‍රමයේ පරමාර්ථ—

(අ) තම මහලු වයසේ දී හෝ අබලතාවක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම ;

(ආ) ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම ;

(ඇ) තම ජීවනෝපායෙහි දිගට ම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරලීම ;

(ඈ) තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම ; සහ

(ඉ) ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩිදියුණු කිරීම

වන්නේ ය.

*යෝජනා ක්‍රමයේ පරමාර්ථ.*

**4.** අමාත්‍යවරයා විසින් යෝජනාක්‍රමය පරිපාලනය කිරීමේ හැකියාව සහ යම් මසුන් ඇල්ලීමේ ක්‍රමයක වෘත්තීය අවදානම ගැන සැලකිලිමත් ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, යෝජනාක්‍රමය ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය තීරණය කරනු ලැබිය හැකි ය.

*යෝජනාක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රදේශය අමාත්‍යවරයා තීරණය කළ යුතු බව.*

යෝජනා ක්‍රමයට බැඳීමේ සුදුසුකම.

5. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, වයසින් අවුරුදු දහ අටට අඩු නොවූ සහ පණස් නවයට වැඩි නොවූ, යම් ධීවරයකුට මේ යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම ඇත්තේ ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "ධීවරයා" යන්නෙන්, සමුද්‍රයෙහි හෝ කලපුවල හෝ අභ්‍යන්තර ජලාශවල හෝ මසුන් ඇල්ලීමෙන් හෝ මසුන් බෝකිරීමෙන් හෝ ස්වකීය ජීවනෝපාය සලසා ගන්නා යම් තැනැත්තකු අදහස් වේ.

(2) යෝජනා ක්‍රමයට බැඳීමට පහත සඳහන් තැනැත්තන්ට හිමිකම නොතිබිය යුතු ය :—

(අ) මුළු බර දළ වශයෙන් ටොන් හයට වැඩි යාන්ත්‍රික බෝට්ටු තුනක හෝ ඊට වැඩි ගණනක අයිතිකරුවෙක් ;

(ආ) මුළු වපසරිය අක්කර පහකට වැඩි ධීවර කොටු එකක හෝ ඊට වැඩි ගණනක අයිතිකරුවෙක් ;

(ඇ) තම සේවා නියුක්තිය හේතුකොට ගෙන විශ්‍රාම වැටුපක් හෝ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල යටතේ ප්‍රතිලාභ හෝ ලැබීමට හිමිකම ඇති තැනැත්තෙක් ;

(ඈ) ආදායම් බදු ගෙවීමට යටත් තැනැත්තෙක් ;

(ඉ) විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තෙක් ; හෝ

(ඊ) තම කලත්‍රයා මියගිය විට, විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇති තැනැත්තෙක්.

යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.

6. (1) මේ යෝජනාක්‍රමයට බැඳෙන්නා වූ (මෙහි මින් මතු "දායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවරයකු යෝජනා ක්‍රමය යටතේ නියම කරනු ලබන පදනමක් මත ගණන් බලනු ලබන පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතු ය :—

(අ) නියමිත මුදල් ප්‍රමාණයක, කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ;

(ආ) ස්ථිර අර්ධ අබලතාවක් සම්බන්ධයෙන් වූ විට, එක් වර ගෙවන මුදලක පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතු වන අවස්ථාවේ විශ්‍රාම වැටුපක් ;

(ඇ) ස්ථිර පූර්ණ අබලතාවක් සම්බන්ධයෙන් වූ විට, එක් වර ගෙවන මුදලක පාරිතෝෂිකයක් හෝ නියමිත මුදල් ප්‍රමාණයක කාල පරිච්ඡේද අනුව දීමනාවක් ; හෝ

(ඈ) මරණ පාරිතෝෂිකයක්.

(2) වෙනත් කරුණු අතර, දායකත්වයේ කාලසීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ ගණන් බැලීමේ පදනම නියම කරනු ලැබිය යුතු ය.

**විශ්‍රාම වැටුප ගෙවිය යුතු අවස්ථාව.**

7. (1) දායකයකු තම වයස අවුරුදු හැට වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය. එසේ වුවද තම වයස අවුරුදු පණස් පහ වූ පසුව දායක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයකු නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවීමෙන් පසුව සහ යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට අවුරුදු පහක් අවසාන වීමේදී පමණක්, විශ්‍රාම වැටුපකට හිමිකම ලැබිය යුතු ය.

(2) දායකයා මියගිය මාසයේ අවසානය දක්වා විශ්‍රාම වැටුප ගෙවනු ලැබිය යුතු ය.

**දායක මුදල මත ප්‍රතිදානය.**

8. යෝජනාක්‍රමයට බැඳීමට සිවරයන් දිරිගැන්වීමේ පරමාර්ථයෙන්, අමාත්‍යවරයා විසින්, දායකයා විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් මත ප්‍රතිදානයක් හෝ වට්ටමක් හෝ නියම කරනු ලැබිය හැකි ය.

**අර්ධ ලෙස අබලවීම.**

9. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර ස්ථිර ව හා අර්ධ ලෙස අබල වූ යම් දායකයකු විසින්, යෝජනාක්‍රමය යටතේ නියමිත පදනම මත ගණන් බලන ලද අබලතා පාරිතෝෂිකයක් ලබා ගෙන යෝජනාක්‍රමයෙන් ඉවත්වීම හෝ තවදුරටත් දායක මුදල් නොගෙවමින් යෝජනාක්‍රමයෙහි රැඳී සිට විශ්‍රාම වැටුප් ලැබිය යුතු වන අවස්ථාවේ එය ලබා ගැනීම හෝ සිය මනාපය පරිදි කරනු ලැබිය යුතු ය.

**පූර්ණ ලෙස අබලවීම.**

10. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර ස්ථිර ව හා පූර්ණ ලෙස අබල වූ යම් දායකයකු විසින්, යෝජනා ක්‍රමය යටතේ, නියමිත පදනම මත ගණන් බලන ලද අබලතා පාරිතෝෂිකය ලබා ගෙන යෝජනාක්‍රමයෙන් ඉවත් වීම හෝ යෝජනාක්‍රමය යටතේ නියමිත පදනම මත ගණන් බලන ලද අබලතා දීමනාවක් ජීවිත කාලය පුරා ලබා ගනිමින් තවදුරටත් දායක මුදල් නොගෙවා යෝජනාක්‍රමයෙහි රැඳී සිටීම හෝ සිය මනාපය පරිදි කරනු ලැබිය යුතු ය.

**මරණ පාරිතෝෂිකය.**

11. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර, දායකයකු මියගිය විට, යෝජනා ක්‍රමය යටතේ නියමිත පදනම මත ගණන් බලන ලද මරණ පාරිතෝෂිකයක්, ජීවත් ව සිටින භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාට හෝ, එවැනි භාර්යාවක හෝ ස්වාමි පුරුෂයකු හෝ නොමැති විට, මේ පනතේ උපලේඛනයේ ප්‍රමුඛතා අනුපිළිවෙලින්, 20(ආ) වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් ව, ඔහු වෙනු ලැබිය යුතුය; යම් ගණයක එක් ඥාතියකුට වැඩියෙන් සිටින අවස්ථාවක, වයසින් වැඩි තැනැත්තාට ප්‍රමුඛත්වය දිය යුතු ය.

## II වන කොටස

### යෝජනාක්‍රමය පාලනය කිරීම

කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් යෝජනා ක්‍රමය මෙහෙයවනු ලැබිය යුතු බව.

**12.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන, කෘෂිකර්ම රක්ෂණ පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් අමාත්‍යවරයා විමසා මේ යෝජනාක්‍රමය මෙහෙයවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය.

**13.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනතින් මණ්ඩලය වෙත පැවරී ඇති බලතලවලට අතිරේක ව, පහත දැක්වෙන බලතල, කර්තව්‍ය සහ කාර්ය මණ්ඩලයට තිබිය යුතු ය :—

(අ) යෝජනාක්‍රමයට අදාළව, මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ආ) යෝජනාක්‍රමයට අදාළ යම් කාරණයක්, උපදේශක කාරක සභාව වෙත, උපදෙස් සඳහා යොමු කිරීම ;

(ඇ) යෝජනාක්‍රමය සම්බන්ධයෙන් අවශ්‍ය ජීවගණක, මූල්‍ය සහ මෙහෙයවීම් වාර්තා පවත්වාගෙන යාම ;

(ඈ) යෝජනාක්‍රමය පිළිබඳ ව සමීක්ෂණ, අධ්‍යයන හා සමාලෝචන කර, අවශ්‍ය වූ ද මණ්ඩලයට බලය ඇත්තා වූ ද අවස්ථාවල මෙහෙයවීම් රීතිවල වෙනස්කම් ඇති කිරීම ;

(ඉ) යෝජනාක්‍රමය යටතේ යම් දායකයකුට ගෙවනු ලැබිය යුතු ප්‍රතිලාභ තීරණය කිරීම ;

(ඊ) යෝජනාක්‍රමය කාර්යක්ෂම ලෙස පාලනය කිරීම සඳහා අවශ්‍ය නිලධරයන්, සේවකයන් සහ වෙනත් සේවා නියුක්තයන් සේවයෙහි යොදවා ගැනීම ; සහ

(උ) යෝජනාක්‍රමය මෙහෙයවීම සහ පාලනය කිරීම පහසු කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේවල් කිරීම.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පැවරීම.

**14.** (1) 13 වන වගන්තිය යටතේ වූ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක්, මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට හෝ මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් පවරනු ලැබ සිටින සභාපතිවරයා, සාමාජිකයකු හෝ නිලධරයකු විසින්, මණ්ඩලයේ සාමාන්‍ය විධාන යට යටත් ව, එම බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍යයන් කිරීම හෝ කාර්ය ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

**15.** යම් තැනැත්තකු දායකයකු ලෙස බඳවා ගනු ලැබූ විට, මණ්ඩලය විසින් ඔහු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එහි ඔහු විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල, සහතිකයේ නියමයන් සහ කොන්දේසි සහ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ ඔහුට හිමිවන ප්‍රතිලාභ සඳහන් ව තිබිය යුතු ය.

එක් එක් දායකයා වෙත මණ්ඩලය විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු බව.

**16.** (1) දායකයකු විසින් දායක මුදල් ගෙවිය යුත්තේ යම් දිනයකට පෙර ද, ඒ දිනය සහතිකයේ නිශ්චය වශයෙන් දක්වා තිබිය යුතු අතර, අනුගාමී වාරික දහයක් ගෙවීම පැහැර හරින යම් දායකයකුට, ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි විය යුතු ය.

සහතිකය අහිමිවීම.

(2) යම් දායකයකු වෙත නිකුත් කර ඇති සහතිකය යටතේ ප්‍රතිලාභ ඔහුට අහිමි වී ඇති අවස්ථාවක, ඒ බවට දැන්වීමක් මණ්ඩලය විසින්, ඒ දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනය කිරීමේ අයිතිය දායකයකුට තිබිය යුතු අතර, වාරික ගෙවීමට අපොහොසත් වීමේ හේතු දායකයාට පාලනය කළ නොහැකි වූ ඒවා බවට මණ්ඩලය සෑහීමට පත් වුවහොත්, මණ්ඩලය විසින් සහතිකය වලංගු කරනු ලැබිය යුතු ය.

(4) සහතිකයක් වලංගු කිරීමට මණ්ඩලය තීරණය කරන අවස්ථාවක, හිඟ වාරික ගෙවිය යුත්තේ යම් දිනයකට පෙර ද, ඒ දිනය, දායකයා වෙත දැනුම් දිය යුතු ය. එකී ගෙවීම කරන දිනය, සහතිකය වලංගු වීමේ දිනය විය යුතු ය.

(5) මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් දායකයකුට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු අතර, ඒ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

**17.** යෝජනාක්‍රමය යටතේ යම් දායකයකුට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම, මණ්ඩලය විසින් යෝජනාක්‍රමයට හා යෝජනාක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා සාදන ලද නියෝගවලට අනුකූල ව තීරණය කරනු ලැබිය යුතු ය.

ප්‍රදානය, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

**18.** (1) මණ්ඩලය විසින් තීරණය කරන ලද ප්‍රතිලාභ ප්‍රදානයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවූ යම් දායකයකු විසින්, ඒ ප්‍රදානය පිළිබඳ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත දී, තම අභියාචනයට හේතු සඳහන් කරමින්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

අභියාචනය.

(2) එවැනි අභියාචනයක් පිළිබඳව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, 16 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ යටතේ ඔහු වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණය, අභියාචකට සහ මණ්ඩලයට දැනුම් දෙනු ලැබිය යුතු ය. එවැනි සෑම තීරණයක් ම ක්‍රියාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව පවරාදීම හෝ ඉන් අයකර ගැනීම හෝ නොකළ යුතු බව.

**19.** යෝජනාක්‍රමයෙන් ගෙවනු ලැබිය හැකි කිසිම විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක් පවරාදීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු අතර, සෑම පවරා දීමක් ම හෝ අන්සතු කිරීමක් ම සම්පූර්ණයෙන් ම ශූන්‍ය, අවලංගු හා බල රහිත වන්නේ ය. විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ දීමනාව හෝ ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හෝ සම්බන්ධයෙන් එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් තහනමට ගැනීම හෝ රීති ආඥා ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීම හෝ කරනු නොලැබිය යුතු ය.

## III වන කොටස

### උපදේශක කාරක සභාව

උපදේශක කාරක සභාව.

**20.** පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක කාරක සභාවක් විය යුතු ය:—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හය දෙනෙක්, එනම්—

(i) කාරක සභාවේ සභාපතිවරයා විය යුතු කම්කරු රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා;

(ii) ධීවර අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(iii) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(iv) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන ජීවගණකවරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරිවරයා හෝ ඔහුගේ නියෝජිතයා;

(vi) කම්කරු කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජිතයා.

(ආ) පහත දැක්වෙන ආකාරයට නම් කරනු ලැබූ, සාමාජිකයන් හය දෙනෙක්, එනම්—

(i) අමාත්‍යවරයා විසින් තමා භාරයේ ඇති අමාත්‍යාංශයෙන් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(ii) මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයෙන් නම් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(iii) කෘෂිකර්ම රක්ෂණ විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින්, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයෙන් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(iv) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පිළිබඳව පුළුල් දැනීමක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක්.

උපදේශක කාරක සභාවේ සාමාජිකයන් ගේ නුසුදුසුකම් හා ධුර කාලය.

**21.** (1) යම් තැනැත්තකු කාරක සභාවේ සාමාජිකයකු ලෙස නම් කරනු ලැබීමට හෝ කාරක සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කිරීමට.—

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු නම් ; හෝ

(ආ) ඔහු විසින් එවැනි සාමාජිකයකු වශයෙන් තම කාර්ය ඉටු කරනු ලැබීම කෙරෙහි හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති මුදල් පිළිබඳ හෝ වෙනත් යම් සම්බන්ධතාවක් ඔහුට ඇත් නම්

ඔහු නුසුදුස්සකු විය යුතු ය.

(2) කාරක සභාවේ සෑම නම් කළ සාමාජිකයකුම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් නැතහොත් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් ධුරය දැරිය යුතු ය.

(3) කාරක සභාවේ නම් කළ සාමාජිකයකු ඉහත සඳහන් ආකාර යට කලින් ධුරය හිස් කරන අවස්ථාවක, 20(ආ) වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් ව, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයා, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකුගේ ධුරයට ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරි ව ඇති කාල පරිච්ඡේදය තුළ ධුරය දැරිය යුතු ය.

(4) යම් හේතුවක් නිසා සභාපතිවරයාට තම ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වේ නම්, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස තත් කාලයෙහි වැඩ බලන තැනැත්තා, කාරක සභාවේ සභාපතිවරයා ලෙස වැඩ බැලිය යුතු අතර, ඔහු එසේ වැඩ බලන කාලයේ දී කාරක සභාවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම හෝ වෙනත් යම් හේතුවක් හෝ නිසා කාරක සභාවේ යම් නම් කළ සාමාජිකයකුට තම කාර්යභාරයන් කිරීමට නොහැකි වුවහොත් 20(ආ) වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් ව, ඔහු වෙනුවට වැඩ බැලීම පිණිස වෙනත් තැනැත්තකු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(6) කාරක සභාවේ යම් නාම් කළ සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා සිතයි නම්, ඔහු විසින්, ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා, ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, කාරක සභාවේ යම් නාම් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයකු හැර, ධුරය හිස් කරන කාරක සභාවේ යම් සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

**කාරක සභාවේ බලතල.**

22. කාරක සභාව විසින්, පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :—

(අ) මණ්ඩලය විසින් කාරක සභාව වෙත කලින් කල යොමු කරනු ලැබිය හැකි, යෝජනාක්‍රමය කළමනාකරණය කිරීමට, මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳ ව, මණ්ඩලයට උපදෙස් දීම ;

(ආ) මණ්ඩලයේ පිහිටුවීමට අදාළ ව, මණ්ඩලයට උපදෙස් දීම ;

(ඇ) යෝජනා ක්‍රමය කාර්යක්ෂම ව කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීම සඳහා යෝජනාක්‍රමය යටතේ ප්‍රතිපත්ති සකස් කිරීම ;

(ඈ) යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම, මෙහෙයවීම හා ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් මණ්ඩලයේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම ;

(ඉ) යෝජනාක්‍රමය කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම.

**කාරක සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.**

23. මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක්, කාරක සභාවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා කාරක සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය. කාරක සභාවේ කටයුතුවලට සම්බන්ධ කාර්යයන් සඳහා සාමාජිකයන් විසින් දරනු ලැබිය හැකි ගමන්, හෝටල් සහ වෙනත් වියදම්, මණ්ඩලය විසින්, ඒ සාමාජිකයන් වෙත ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

**කාරක සභාවට අදාළව අමාත්‍යවරයාගේ බලතල.**

24. කාරක සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, කාරක සභාව ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

## IV වන කොටස

### ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල

ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල.

25. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) යෝජනාක්‍රමය මෙහෙයවීම සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන් ;

(ආ) යෝජනාක්‍රමයේ කාර්ය සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත අත්තිකාරම් වශයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ඇ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යයන් ඉටු කිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී මණ්ඩලය වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඈ) දායකයන් විසින්, යෝජනාක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඉ) අරමුදල වෙත ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් කවර හෝ සම්භවයකින් ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් ; සහ

(ඊ) ආයෝජනවලින් පොලිය හෝ ලාභ හෝ වශයෙන් උපයා ගන්නා ලද සියලු මුදල් ප්‍රමාණයන්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ කාරක සභාවේ සහ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී කාරක සභාව විසින් සහ මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු මුදල් ප්‍රමාණයන් ද, මේ පනත මගින් හෝ එය යටතේ හෝ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ප්‍රමාණයන් ද අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් ආයෝජනය කිරීම.

26. මේ පනත යටතේ මණ්ඩලයට වහා අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියලු මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් බලය දෙනු ලබන ආකාරයට සහ එසේ බලය දෙනු ලබන සුරැකුම්පත්වල, මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ ණයට ගැනීමේ බලය.

27. (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ එවැනි ම එකඟත්වය ඇතිව දෙන ලද යම් පොදු බලය දීමක නියමයන්ට අනුකූල ව හෝ, මේ පනත යටතේ මණ්ඩලයේ බැඳීම් ඉටු කිරීම සඳහා නැතහොත් යෝජනා ක්‍රමයේ අරමුණු ක්‍රියාවේ යෙදීම සඳහා මණ්ඩලයට අවශ්‍ය වන්නා වූ මුදල් බැංකු අයිරා වශයෙන් හෝ අන් ලෙසකින් ණයට ගැනීම හෝ සාකච්ඡා කර ණය වශයෙන් ලබා ගැනීම හෝ කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ණය සම්බන්ධයෙන් යම් අවස්ථාවක දී පියවීමට ඉතිරි ව ඇති මුළු මුදල් ප්‍රමාණය, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මණ්ඩලය විසින්, පහත දැක්වෙන කාර්යයන් සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සඳහා (1) වන උපවගන්තිය යටතේ වූ ණයක් නොවන වෙනත් ආකාරයකින් මුදල් ණයට ලබා ගත හැකි ය :—

(අ) යෝජනාක්‍රමයේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට අවශ්‍ය චංචල හෝ නිශ්චල දේපළක සන්තකය ලබා ගැනීමට හෝ ඒ දේපළ අත්කර ගැනීමට;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ලබා ගන්නා ලද යම් මුදලක් ආපසු ගෙවීමට.

මුදල් වර්ෂය යනාදිය.

28. (1) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින්, එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට පැවති ආකාරයට මණ්ඩලයේ පොත් තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී දිනය දක්වා සාදන ලද ආදායම් සහ වියදම් ගිණුමක් ද, අරමුදලේ වත්කම්වල හා බැරකම්වල සාරාංශයක් ඇතුළත් වන ශේෂ පත්‍රයක් ද අරමුදලේ මුදල් ආයෝජන පිළිබඳ ව, ඒ ආයෝජනවල ගැනුම් මිල සහ එකී දිනයේ දී ආයෝජනවල වෙළෙඳ අගය දැක්වෙන ප්‍රකාශයක් ද ඊළඟ අප්‍රේල් මාසයේ තිස් වන දිනට පෙර පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය අත්සන් කිරීම මණ්ඩලය විසින් යෝජනා සම්මතයෙන් ඒ සඳහා බලය දෙනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයා විසින් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, සෑම වර්ෂයක දී ම, යෝජනාක්‍රමයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

29. (1) (අ) යෝජනාක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; නියෝග.

(ආ) ධීවරයකු යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ලබන්නේ කවර සුදුසුකම්, කොන්දේසි සහ අවස්ථානුගත කරුණු ඇතිව, සහ කවර සීමා කිරීම් යටතේ ද යන වග ;

(ඇ) දායකයන් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණය තීරණය කිරීම ;

(ඈ) යෝජනාක්‍රමය යටතේ දායකයන් වෙත විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ දීමනා ගෙවිය යුතු පදනම තීරණය කිරීම ;

(ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැරීම, සහතිකය ආපසු භාරදීම සහ දායකයකුගේ සුදුසුකම් අහිමිවීම පාලනය කරන කොන්දේසි ;

(ඊ) මණ්ඩලයේ හෝ කාරක සභාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පරිපාටිය විධිමත් කිරීම ;

(උ) සහතිකය අවසන් කිරීම හෝ අහිමි කිරීම ; සහ

(ඌ) අර්ධ හෝ පූර්ණ අබලතාව තීරණය කිරීමේ පදනම

ඇතුළුව නියම කළ යුතු යයි මේ පනතෙහි ප්‍රකාශිත හෝ නියමිත සියලු කරුණු ද නියෝග සෑදීමට මේ පනතින් නියමිත සියලු කරුණු ද සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි සඳහන් පසු දිනයක දී හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) එවැනි සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකි තාක් ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

30. (1) (අ) මණ්ඩලය හෝ කාරක සභාව හෝ විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට හෝ කාරක සභාවට හෝ විරුද්ධව ; හෝ

(ආ) මණ්ඩලයේ හෝ කාරක සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ, මණ්ඩලයේ නිලධරයකු, සේවක යකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජික යාට, නිලධරයාට, සේවකයාට නැතහොත් අනු යෝජිතයාට විරුද්ධ ව

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකි විය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධ ව ගෙන එන ලද යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාව යෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන හොත්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වැරදි.

31. මේ පනතේ යම් විධිවිධානයක් හෝ පනත යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් හෝ කඩ කරන්නා වූ නැතහොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත්තකු ම, වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක් දහස් පන්සියයක දඩයකට හෝ, ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අනනුකූලතා වක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

32. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනු කූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි.—

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් කෙරේ.

## උපලේඛනය

(11 වන වගන්තිය)

ප්‍රමුඛතාව අනුව, ලේ ඥාතීන්ගේ අනුපිළිවෙල.

(1) පුත්‍රයෝ

(2) දියණියෝ

(3) මුනුබුරෝ

(4) මිනිබිරියෝ

(5) පියා

(6) මව

(7) සහෝදරයෝ

(8) සහෝදරියෝ

(9) පියාගේ හෝ මවගේ සහෝදරයෝ

(10) පියාගේ හෝ මවගේ සහෝදරියෝ

(11) සහෝදරයාගේ හෝ සහෝදරියගේ පුතා

(12) සහෝදරයාගේ හෝ සහෝදරියගේ දුව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.